## 264 අප දිවි දෙරණට

අප දිවි දෙරණට ආසිරි වැසි ඉස මල් එල ඇති කරනා
සමිඳුනි ඔබටයි අප හද කුසුමන් බැතියෙන් සුවඳ වෙනා

ජීවිත ආකරයේ හැකියා මිණිමුතු වේ //
මතුකොට ඔපලා
ඔබ මඟ ගෙන එමු ලොව දියුණුව සපුරා

ලෝ උයනේ මනරම් රස ඇත නෙක විලසින් //
විහඟු කැළක් මෙන්
ඔබ පසුපස එමු විමුක්ති පහස ලබා

ලෙඩ දුක් කටු ඇණුනත් පැරදුමෙ ගලෙ හැපුනත් //
කඳුළැලි අතරින්
ඔබ හා හිනැහෙමු ජීවිත සතුට ලබා